රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/2/4-3(තාවකාලික)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2025.02. 17

**ග්‍රාම නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම - 2020(2023)**

**2024.06.10 දින ආරම්භ කරන ලද ග්‍රාම නිලධාරී ත්‍රෛමාසික පුහුණුව සඳහා වාර්තා නොකල හා පුහුණු කාලය අතරතුර පුහුණුව හැරගොස් ඇති පුහුණුලාභීන් වෙනුවට ග්‍රාම නිලධාරී පුහුණුලාභීන් බඳවා ගැනීම**

උක්ත බඳවා ගැනීම යටතේ ග්‍රාම නිලධාරි III වන ශ්‍රේණියට 2024.06.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දෙන ලද පුහුණු පත්වීම් අතුරින් එම පත්වීම් භාර නොගැනීම සහ පුහුණුව අතරතුර පුහුණුව හැරයාම හේතුවෙන් සම්පූර්ණ කිරීමට නොහැකි වූ ග්‍රාම නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව පුහුණුලාභීන් පිරිසක් ග්‍රාම නිලධාරී ත්‍රෛමාසික පුහුණුව සඳහා කැඳවීමට තීරණය කර ඇති අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ PSC/EST/03-03/02/2021 සමාංක හා 2025.01.29 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව 2023.12.02 දින පැවති 2020(2023) ග්‍රාම නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රමුඛතා ලේඛනය අනුව පුහුණුව සඳහා කැඳවීමට අපේක්ෂිත අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මේ සමඟ ඉදිරිපත් කරමි (ඇමුණුම 01).

03. තවද, බඳවාගනු ලබන නවක පුහුණුලාභීන් හට ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ පටිපාටිය අනුව පැවැත්වෙන ත්‍රෛමාසික පුහුණු වැඩසටහන 2025 පෙබරවාරි 24 වන දින සිට ආරම්භ වීමට නියමිත බවත් මෙම ලේඛනයෙහි නම සඳහන් අයදුම්කරුවන් අනිවාර්යයෙන් 2025.02.24 දිනට අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වාර්තා කල යුතු බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

04. ඇමුණුම 01හි නම සඳහන් සුදුසුකම්ලත් ග්‍රාම නිලධාරී පුහුණුලාභීන් සඳහා මේවන විට පුහුණු පත්වීම් ලිපි තැපැලට යොමු කර ඇත.

ජී.පී.නිශාන්ත
අතිරේක ලේකම්
(ස්වදේශ කටයුතු)

අත් කලේ: එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය